# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2156/27 - 2020 ජනවාරි මස 03 වැනි සිකුරාදා - 2020.01.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය: DSO/HOM/LAC/109.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :-

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිටිපන උතුර ගමේ මැනුම්පති විසින් පිළියෙල කර ඇති අංක 520006-22-20 සහ 2019.09.03 දිනැති කැඩැස්තර සිතියම් කැබලි අංක 400, 404, 405, 406, 408 සහ 412 වශයෙන් පෙන්නුම් කෙරෙන මුළු ප්‍රමාණයෙන් හෙක්. 11.6044ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබලි:

1. **කැබලි අංකය 400**
ඉඩමේ නම: මාහේනවත්ත; විස්තරය: අවු. 30-35 පමණ වයසැති පොල් සහ අවු. 10.15ක් පමණ වයසැති කුරුඳු වගාවක් ඇත; හිමිකම් කියන අය: අයෝමා ඉන්ද්‍රලේඛා වික්‍රමසිංහ, ආරාමවත්ත, මාහේන, පිටිපන, හෝමාගම; ප්‍රමාණය : හෙක්ටයාර 0.5766.

2. **කැබලි අංකය 404**
ඉඩමේ නම: මාහේනවත්ත; විස්තරය: අවු. 30-35 පමණ වයසැති පොල් සහ අවු. 10.15ක් පමණ වයසැති කුරුඳු වගාවක් ඇත; හිමිකම් කියන අය: අයෝමා ඉන්ද්‍රලේඛා වික්‍රමසිංහ, ආරාමවත්ත, මාහේන, පිටිපන, හෝමාගම; ප්‍රමාණය : හෙක්ටයාර 2.4142.

3. **කැබලි අංකය 405**
ඉඩමේ නම: -; විස්තරය: කපන ලද කාණුව; හිමිකම් කියන අය: අයෝමා ඉන්ද්‍රලේඛා වික්‍රමසිංහ, ආරාමවත්ත, මාහේන, පිටිපන, හෝමාගම; ප්‍රමාණය: හෙක්ටයාර 0.0066.

4. **කැබලි අංකය 406**
ඉඩමේ නම: මාහේනවත්ත; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: අයෝමා ඉන්ද්‍රලේඛා වික්‍රමසිංහ, ආරාමවත්ත, මාහේන, පිටිපන, හෝමාගම; ප්‍රමාණය: හෙක්ටයාර 0.4448.

5. **කැබලි අංකය 408**
ඉඩමේ නම: මාහේනවත්ත; විස්තරය: වත්ත, ස්ථිර ගොඩනැගිල්ලක්, සක්මන් මළුවක්, වැසිකිළියක්, වතුර ටැංකියක් සහ අවු. 30-35ක් පමණ වයසැති පොල් සහ අවු. 10-15ක් පමණ වයසැති කුරුඳු වගාවක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: අයෝමා ඉන්ද්‍රලේඛා වික්‍රමසිංහ, ආරාමවත්ත, මාහේන, පිටිපන, හෝමාගම; ප්‍රමාණය : හෙක්ටයාර 7.9510.

**6. කැබලි අංකය 412**

ඉඩමේ නම: මාහේනවත්ත; විස්තරය: වත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත, අවුරුදු 30-35ක් පමණ වයසැති පොල් සහ අවු. 10-15ක් පමණ වයසැති කුරුඳු වගාවක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: අයෝමා ඉන්ද්‍රලේඛා වික්‍රමසිංහ, ආරාමවත්ත, මාහේන, පිටිපන, හෝමාගම; ප්‍රමාණය : හෙක්ටයාර 0.2112.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020 ජනවාරි මස 23 වැනි දින පෙ. ව. 10.00 ට හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2020 ජනවාරි මස 16 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඇති ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තර වන්දි මුදල් හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

බුද්ධි තරංගා කරුණාසේන,
ප්‍රාදේශීය ලේකම්,
හෝමාගම.

2019 දෙසැම්බර් මස 27 වැනි දින,
හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

01-496

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය) 7 වන වගන්තිය යටතේ දැන්වීම**

*මගේ අංකය* : ටීඑච්අයි/එල්එන්ඩී/එල්2/ඒසීකිව්වීඅයි/142.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 4-3/6/2016/එච්ඩබ්ලිව්/242.

තිහගොඩ ප්‍රාදේශීය ලේකම් උමේෂා සුරංගි මාතරගේ වන මම දක්ෂිණ අධිවේගී මාර්ග ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්කර ගැනීමට අදාළව නිකුත් කරන ලද 2019.10.15 දිනැති අංක 2145/25 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* 2ඒ පිටුවෙහි ප්‍රකාශයට පත් කරන ලද 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 7 වන වගන්තිය යටතේ ගැසට් නිවේදනයේ හිමිකම් පරීක්ෂණ දිනය 2020.01.29 වැනි දින ලෙසද, ඊට අදාළ ලියකියවිලි ඉදිරිපත් කළයුතු දිනය 2020.01.22 දින ලෙස ද සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

උමේෂා සුරංගි මාතරගේ,
ප්‍රාදේශීය ලේකම්
තිහගොඩ.

2020 ජනවාරි මස 03 වැනි දින,
ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය,
තිහගොඩ.

01-497

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.